පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - උතුරු මැද පළාත

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරී III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත

තරඟ විභාගය - 2016

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරී III වන ශ්‍රේණියේ තනතුරට අදාළව පවතින පුරප්පාඩු වලට බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති උතුරු මැද පළාතේ ස්ථිර පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම විවෘත තරග විභාගයකින් බඳවාගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **සුදුසුකම්**

1.1. **සාමාන්‍ය සුදුසුකම්**

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ත් 35 ත් අතර විය යුතුය.
(පහත 1.1 vi හි සඳහන් අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 40 වේ.)

iv. ආගමික හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන තැනැත්තෙක් නොවිය යුතුය.

v. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක් උතුරු මැද පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද නාම ලේඛනයේ නම ඇතුළත්විය යුතුය)
කලත්‍රයාගේ ස්ථිර පදිංචිය ද සලකා බලනු ලබන අතර අයදුම්පත්‍රයේ ඊට අදාළ තොරතුරු පැහැදිලිව දක්වා තිබිය යුතුය.

vi. දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකුනම් ඔහු හෝ ඇය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක කාලයක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

1.2. **අධ්‍යාපන සුදුසුකම්**

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් එකවර සමත්ව තිබීම

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

1.3. **වෘත්තීය සුදුසුකම්**

(අ) යම්කිසි ක්‍රීඩා ඉසව්වක ජාතික කණ්ඩායමේ සාමාජිකයෙකුව පිළිගත් ජාත්‍යන්තර තරගයකට සහභාගීවී තිබීම.

හෝ

(ආ) ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලෙහිදී යම් ඉසව්වකින් ජාතික මට්ටමින් 1, 2, 3 ස්ථාන ලබා තිබීම හෝ පළාත් මට්ටමින් 1, 2 ස්ථාන ලබා තිබීම.

සටහන : බඳවා ගැනීම් කිරීමේදී 1.3 (අ) යටතේ දක්වා ඇති පරිදි ජාත්‍යන්තර තරග සඳහා සහභාගීවූවන්ට හා ජාතික මට්ටමින් 1, 2, 3 ස්ථාන ලබා ඇති අයවලුන්ට ඉහත 1.2 අධ්‍යාපන සුදුසුකම් යටතේ "ආ" හි සඳහන් අ. පො. ස. (උ/පෙළ) එක් විෂයයක් සමත්වීම මත මේ සඳහා ඉල්ලුම් කළ හැකිය. ජාත්‍යන්තර තරග යනුවෙන් අර්ථ ගන්වන්නේ ඔලිම්පික්, ලෝක කුසලාන, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරග, ආසියානු කනිෂ්ඨ ක්‍රීඩා තරග, ආසියානු තරගාවලි, දකුණු ආසියානු තරගාවලි හා දකුණු ආසියානු කනිෂ්ඨ තරගාවලි ආදියයි.

1.4. **කායික සුදුසුකම්**

සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, ශාරීරික යෝග්‍යතාවය පිරික්සීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා ක්‍රීඩා වෛද්‍ය ඒකකය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය. එම පරීක්ෂණය, ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ශක්තිය, දෑත්වල ශක්තිය, උලංගීතාවය, හිටි දුර පැනීම හා වේගය හා දරාගැනීම යන අංගයන්ගෙන් සමන්විත වේ.

1.5. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර මෙහි සඳහන් කර ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

02. **බඳවා ගැනීමේ සේවා කොන්දේසි**

2.1. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් හා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල පිළිබඳව 2016 අයවැය යෝජනාව අනුව ඉදිරියේදී සකස්වන රාජ්‍ය ප්‍රතිපත්ති අනුව තීරණය කරනු ලැබේ.

2.2. මෙම පත්වීම ලබන අය උතුරු මැද පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

2.3. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව දිස්ත්‍රික් අනුපාතය පදනම් කර ගනිමින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.4. **වැටුප් ක්‍රමය** : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව ක්‍රීඩා නිලධාරී තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව) MT 1-2016 දරන වැටුප් මණ්ඩිය යටතේ රු. 29840-10x300-11x350-10x560-10x660-48890 වේ. උක්ත චක්‍රලේඛයේ උප ලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.

03. **බඳවා ගැනීමේ ක්‍රමය** :

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විවෘත තරග විභාගයක් පවත්වනු ලබන අතර, එම තරග විභාගයේ ප්‍රතිඵල මත එක් එක් විෂයය 40% ට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබන අයදුම්කරුවන්ගේ ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඒ අනුව පත්වීම් බලධරයා විසින් අයදුම්කරුවන් ව්‍යුහගත පරීක්ෂණයට භාජනය කිරීමෙන් පසු ලබා ගන්නා ඒකාබද්ධ ලකුණු සංඛ්‍යාව අනුව සකස් කරනු ලබන කුසලතා ලේඛනයට ඇතුළත්වන අයගෙන් ක්‍රීඩා විද්‍යායතනයේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අය අතරින් ඉහළම ලකුණුලාභීන් මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාවට සමාන හෝ ඊට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇති විට ඔවුන් ක්‍රීඩා විද්‍යායතනයේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට භාජනය කොට ඉන් සමත් වන්නන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

3.2. විවෘත තරග විභාගය :

3.2.1 **ලිඛිත පරීක්ෂණය** :

මෙම විභාග සිංහල, දෙමළ යන භාෂා මාධ්‍යයන් දෙකෙන්ම පැවැත්වේ. මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

විෂයයන්	කාලය	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
1. බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40%
2. භාෂා හැකියාව	පැය 01	100	40%

3.2.2 විභාගය සඳහා වන විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
1. බුද්ධි පරීක්ෂණය	අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.
2. භාෂා හැකියාව	අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, කිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි

3.3.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම පහත සඳහන් නිර්ණායක අනුව සිදු කෙරේ.

	ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය
1.	අධ්‍යාපන සුදුසුකම්	10
2.	ක්‍රීඩා දක්ෂතාවයන්	70
3.	ක්‍රීඩා තරග සඳහා පුහුණු කිරීම, විනිශ්චය සංවිධානය	10
4.	ජාත්‍යන්තර භාෂා ප්‍රවීණතාවය	05
5.	පෞරුෂය	05

4.0. විභාගය පැවැත්වීමට යෝජිත නගර සහ නගර අංක පහත අයුරින් වේ.

නගරය	නගර අංකය
අනුරාධපුරය	01
පොළොන්නරුව	02

යම් නගරයක් සඳහා ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ නම්, විභාගය පැවැත්වෙන අනෙක් නගරයේ විභාග මධ්‍යස්ථානය වෙත අපේක්ෂකයින් යොමු කරනු ඇත.

5.0. **අයදුම්කිරීමේ ක්‍රමය**

5.1. අයදුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව අපේක්ෂකයා විසින් කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් A 4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය.

5.2. නියමිත ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා නියමිත දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ද, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති අයදුම්පත්‍ර ද, කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

5.3. ඉල්ලුම්පතෙහි ඡායා පිටපත් භාරගනු නොලැබේ. (ඉල්ලුම්පතේ ඡායා පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාගයට අදාළ වන ප්‍රවේශපත්‍ර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අයදුම්කරුවන් වෙත එවනු ලැබේ. විභාග ප්‍රවේශපත් එවීම තුළින් ඔබගේ සුදුසුකම් සනාථ කළ බව සැලකිල්ලට නොගත යුතුය.

5.4 විභාග ගාස්තු : උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පළාත් සභා ගිණුමට බැර වන සේ රු. 300 ක මුදලක් ගෙවා ලබා ගන්නා ලද NC-100 ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත තීරුවේ නොගැලවෙන ලෙස අලවා එවිය යුතුය (ලදුපතේ පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) කිසිම හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු නොගෙවනු ලබන බවත් එම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමට ඉඩ නොදෙන බවත් සැලකිල්ලට ගත යුතුය.

5.5 ඉල්ලුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්චයකරුවෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන 2016.01.01 දිනට රු 24,340/- කට නොඅඩු මාසික වැටුපක් ලබන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබිය යුතුය.

5.6 රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

5.7 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2016.10.20 දිනට පෙර "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, උතුරු මැද පළාත, අනුරාධපුර**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත් යොමු කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරී III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම**" ලෙසද දෙවැනි පෙළෙහි විභාගය සඳහා ඉදිරිපත් වීමට අපේක්ෂිත නගරය කුමක්ද යන්න පිළිබඳවත් පැහැදිලිව සඳහන් කළ යුතුය.

5.8 තැපැල් කිරීමේ දී අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

මෙම තනතුරු පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු වලින් කොටසක් හෝ සියල්ලම හෝ නොපිරවීමේ බලය මෙන්ම දැන්වීමෙන් අනාවරණය නොවන යම් කරුණක් වේ නම් ඒ පිළිබඳව තීරණ ගැනීමේ බලය ද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. තවද මෙහි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

ආර්. එම්. වන්නිනායක, ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත.
2016.09.14

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරී III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2016

විභාගයට පෙනී සිටින නගරය : ☐
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐
(අදාළ කොටුව තුළ ලියන්න) සිංහල -S දෙමළ -T

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) මයා/මිය/මෙනවිය
සිංහලෙන් : ....
ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරින්) ....

02. මුලකුරුවලින් හැඳින්වෙන නම
සිංහලෙන් : ....
ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරින්) ....

03. තැපැල් ලිපිනය
සිංහලෙන් : ....
ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරින්) ....

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐
05. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐
06. ස්ත්‍රී/පුරුෂභාවය : පුරුෂ (M) ☐ ස්ත්‍රී (F) ☐
07. උපන් දිනය : වර්ෂය : ☐ මාසය : ☐ දිනය : ☐
2016.09.26 දිනට වයස වර්ෂ : ☐ මාස : ☐ දින : ☐
08. විවාහක අවිවාහක බව..........
කලත්‍රයාගේ පදිංචි දිස්ත්‍රික්කය .... (දැන්වීමේ 1.1 (V) අනුව අදාළ අයදුම්කරුවන් සඳහා පමණි)
පදිංචිකාලය .... ග්‍රාම නිලධාරී කොට්ඨාසය .... අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ....
09. ජාතිය : ....
10. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ....
(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ....
(ඇ) පදිංචිව සිටි කාල සීමාව: අවු .... මාස : .... දින : ....
11. **අධ්‍යාපන සුදුසුකම්**

11.1 අ. පො. ස. (සා/පෙළ) විභාගය
වර්ෂය .... විභාග අංකය ....

විෂය	සාමාර්ථය	විෂය	සාමාර්ථය
1		5	
2		6	
3		7	
4		8	

11.2 අ. පො. ස. (උ/පෙළ) විභාගය
වර්ෂය .... විභාග අංකය ....

විෂය	සාමාර්ථය
1	
2	
3	
4	

11.3 වෘත්තීය සුදුසුකම් : ....
: ....
11.4 වෙනත් සුදුසුකම් : ....
: ....

12. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු වී තිබේද?
ඔව් ☐ නැත ☐
පිළිතුර "ඔව්" නම් විස්තර සඳහන් කරන්න.
....
....

13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ....
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය ....
(ii) ලදුපත් අංකය හා දිනය ....
(iii) ගෙවූ මුදල ....

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

14. අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. (තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ප්‍රකාශ කරමි.)

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ....
අයදුම්කරුගේ අත්සන

සම්පූර්ණ නම ....
තනතුර : ....
ලිපිනය : ....
(තනතුරු නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුයි)
දිනය : ....

16. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉදිරිපත් කළ යුතුය.

මෙම ඉල්ලුම්කරු වන .... මහතා / මහත්මිය / මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ .... වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

දිනය : ....
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව සහිතව)